# පැරණි අමරසේකර හා නූතන අමරසේකර

අපට අවශ්‍ය වන්නේ අපේ ප්‍රවාද නිර්මාණය කිරම ය. ඒ බව නැවත නැවතත් මතක් කළ යුත්තේ ඇතැමුන්ට මේ ලිපි පෙළේ අරමුණ තාවකාලික ව වුව ද අමතක වීමට ඉඩ ඇති බැවින් ය. අපේ ප්‍රවාද අද නිර්මාණය කිරමට නොහැකි වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම අපට අප කෙරෙහි විශ්වාසයක් නැති බැවින් ය. අප උත්සාහ කරන්නේ බටහිරයන් විසින් නිර්මාණය කෙරෙන චිත්‍රවලට හා වෙනත් කලාවන්ට මෙන් ම විද්‍යාවට ද යම් චින්තන පසුබිමක් ඇති බව පෙන්වීමට ය. අද ලොවේ ඇත්තේ බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තන ආධිපත්‍යයකි. බටහිරයෝ මුළු ලොවට ම තම චින්තනය ලබා දී ඇති අතර අද සමාජයේ පිළිගැනීමක් ඇත්තේ ඒ චින්තනයට එකඟ ව කටයුතු කරන්නන්ට ය.

බටහිර රටවල් ලෝකයේ දියුණු ම රටවල් ලෙස හඳුන්වනු ලැබ ඇත. ඇතමකුට ඒ වාක්‍යය ම පුදුමයට පත් කරන්නක් විය හැකි ය. යමකු ඒ රටවල් ලෝකයේ දියුණු රටවල් නොවේ දැයි ද එබැවින් ඒ රටවල් දියුණු රටවල් ලෙස හඳුන්වනු ලැබ ඇත යන්නෙහි තේරුම කුමක් දැයි ද ඇසීමට ඇති ඉඩකඩ බොහෝ ය. එහෙත් අප තරමක් විමසිලිමත් වුව හොත් අපට පෙනී යන කරුණ නම් ඒ රටවල් දියුණු යැයි කියන්නේ යම් යම් නිර්ණායක පදනම් කරගනිමින් බව ය. ඒ රටවල ජනතාව අනෙක් රටවල් සමග සංසන්දනය කිරමේ දී ඉතා විශාල බලශක්ති ප්‍රමාණයක් යොදා ගනිති. දියුණුවේ පදනම මේ බලශක්තිය යොදාගැනීම ලෙස අද පිළිගැනී ඇත.

එහෙත් ඒ ඇතැම් රටවල නොමිලයේ ලැබෙන සෞඛ්‍ය සේවයක් නැත. සෞඛ්‍ය රකෂණයක් ලබා නොමැති නම් යමකුට දෙවියන්ගේ ම පිහිට ය. අද මෙරට ප්‍රචාරය කෙරෙන එක්තරා වෙළෙඳ දැන්වීමක සෞඛ්‍ය ආරකෂණය අවසන් වීමත් සමග සුවය අත් වුවත් නැතත් ගෙදර යැමට සිදු වන රෝගියකු පෙන්වනු ලැබෙයි. මෙය අතිශයෝක්තියක් ලෙස පෙනී ගිය ද ඒ ගෙවීමක් නොමැති ව සේවයක් ලබාගත නොහැකි ය යන මූලධර්මය විදහා දක්වන වෙළෙඳ දැන්වීමකි. ඒ වෙළෙඳ දැන්වීම ද ප්‍රචාරය වන්නේ ගෙවීමකට පසුව බව අමතක නො කළ යුතු ය. නියමිත ගෙවීම කර නැත්නම් අදාළ රූපවාහිනී නාළිකාව වෙළෙඳ දැන්වීම ප්‍රචාරය කිරම ද අත්හිටවීමට පියවර ගනු ඇත.

බටහිර රටවල පුද්ගලයන් අතර ඇති සම්බන්ධකම්, මහලු වියේ දී මවුපියන්ට දරුවන්ගෙන් වෙන් වී ගත කිරමට සිදුවන ජීවිතය, විවාහ ජීවිත කඩාකප්පල්වීම්, ස්ත්‍රී දූෂණ, මිනීමැරුම් හා වෙනත් අපරාධ ආදිය පිළිබඳව අපි කතා නො කරමු. එයට හේතුව එවැනි නිර්ණායක සමාජයක් දියුණු ද, නැත් ද යන්න තීරණය කිරමේ දී යොදා නො ගැනීමට බටහිරයන් තීරණය කර තිබීම ය. රටක් සමාජයක් දියුණු ද, නැත් ද යන්න තීරණය කරන නිර්ණායක වාස්තවික දැ නො වේ. ඒ නිර්ණායක ද සමාජයට, එනම් සංස්කෘතියට සාපේකෂ ය. බටහිර රටවලට ඇති ආධිපත්‍යය හේතු කොටගෙන ඒ නිර්ණායක සකස් කරනු ලබන්නේ ඔවුන්ගේ බුද්ධිමතුන් විසිනි.

බටහිරයන් දියුණුව යනු කුමක් ද, සමාජයක් දියුණු වී ඇත් ද ආදිය තීරණය කරණ නිර්ණායක සකස් කර තිබෙන්නේ ම ඔවුන්ගේ රටවල් දියුණු යැයි තීරණය කෙරෙන ආකාරයට ය. ඇද ඇතැමුන් අසමත් රාජ්‍ය ගැන කතා කරන්නේ ද බටහිරයන් විසින් සකස් කෙර ඇති නිර්ණායක පදනම් කර ගනිමිනි. මේ නිර්ණායකවල ද ඇති වාස්තවිකත්වයක් නැත. බටහිර රටවල ප්‍රකාශනයේ නිදහස ඇතැ යි කියැවෙයි. එහෙත් ඒ නිදහස හුදු වියුක්ත නිදහසක් පමණකි. මෙහි දී අපි අප රට ම උදාහරණයකට ගනිමු. ප්‍රකාශනයේ නිදහස තිබුණ ද අප සියලු දෙනාට ම අපට අවශ්‍ය ආකාරයට අපේ අදහස් ප්‍රසිද්ධියට පත් කිරමට නොහැකි ය.

පුවත්පතකට ලිපියක් ලියූ පමණින් ඒ පළ නො වන බව අපි දනිමු. අපට අවශ්‍ය වුව ද අප සිතූ සේ රූපවාහිනියෙහි පෙනී සිට අදහස් ප්‍රකාශ කිරමේ අවස්ථාව අපට උදා නො වේ. අවශ්‍ය වුව ද චිත්‍රපටියක් නිෂ්පාදනය කිරමට අපට නොහැකි ය. ඒ සඳහා ප්‍රතිපාදන අවශ්‍ය වෙයි. ප්‍රංශය වැනි බටහිර රටකින් මුදල් ලැබෙන්නේ කිනම් ආකාරයක චිත්‍රපටි නිපදවීමට දැයි ඔබ සිතන්නෙහි ද? සිංහල බෞද්ධ ක්‍රමයට අනුව අපේ ජීවිත සකස් විය යුතු ය යන තේමාව රැගත් චිත්‍රපටියක් නිෂ්පාදනය කිරමට අපට ප්‍රංශයෙන් මුදල් ලැබේ ද?

© Prof. Nalin De Silva

ඉහතින් දක්වා ඇත්තේ බටහිර සංස්කෘතික ආධිපත්‍යයත්, එහි කොටසක් වූ දැනුම් ආධිපත්‍යයත් හේතු කොටගෙන අපට මුහුණ පෑමට සිදු වී ඇති දෙයින් බිඳක් පමණකි. අප කටයුතු කරන්නේ අපේ නිදහස වෙනුවෙන් ය. දැනුම නිර්මාණය කිරමට අපට ද නිදහසක් තිබිය යුතු යැයි අපි කියා සිටිමු. මේ ලිපි පෙළෙහි මේ දිනවල කථා කෙරෙන්නේ ඉතා ම සංවේදී කරුණු ය. ඒ සම්බන්ධයෙන් විවිධ පුද්ගලයන්ට විවිධ විවේචන තිබිය හැකි ය. ඇතැමුන් ඒ සම්බන්ධයෙන් කේන්තියෙන් කතා කරනු ඇත. ඒ වැළැක්විය හැකි නො වෙයි. අප කෙතරම් විද්‍යාව ගැන කතා කළ ද අපේ ජීවිතවලට සාහිත්‍යය, කලාව වඩා සංවේදී වෙයි. එහෙත් අප ඒ අයගෙන් ඉල්ලා සිටින්නේ තමන් යම් නිගමනයකට එළඹෙන්නේ කිනම් පසුබිමක ද යන්න ගැන නිතර ම සොයා බලන ලෙස ය.

මාර්ටින් වික්‍රමසිංහ හා එදිරිවීර සරච්චන්ද්‍ර යන මහත්වරුන්ට මෙරට ආධිපත්‍යවාදී බලයක් ඇත. මෙහි දී ඒ මහත්වරුන්ට බලයක් ඇතැ යි යන්න, ඒ මහත්වරුන්ගේ අදහස්වලට බලයක් ඇතැ යි යන්න ලෙස තේරුම් ගත යුතු ය. අප ප්‍රශ්න කරන්නේ ඒ අදහස්වලට මෙරට සිංහල බෞද්ධ සමාජයෙහි මෙතරම් බලයක් ලැබුණේ කෙසේ ද යන්න ය. ඒ අදහස්වලට භික්ෂුන්වහන්සේගේ අදහස් පැරදවීමේ හැකියාව ලැබුණේ කෙසේ ද? මාර්ටින් වික්‍රමසිංහ මහතාට වඩා බුදු දහම ගැන අවබෝධයක් තිබූ යක්කඩුවේ ප්‍රඥාරාම හිමිපාණන් වහන්සේගේ අදහස් මෙරට සමාජයෙහි අද වැදගත් නො වන්නේ ඇයි?

මාර්ටින් වික්‍රසිංහ මහතාගේ බවතරණයට එරෙහි ව යක්කඩුවේ නාහිමියෝ පොත් දෙකක් ම ලියූ හ. උන්වහන්සේ ඒ පොත් ලියුවේ බවතරණය නො කියවා නො වේ. මාර්ටින් වික්‍රමසිංහ මහතාට උන්වහන්සේගේ විවේචනයට දිය හැකි පිළිතුරක් නො තිබුණි. භික්ෂුන්වන්සේ තමන්ගේ පොත විවේචනය කෙළේ පොත නො කියවා ය වැනි ලාබ කතාවක් කියා ප්‍රශ්නයෙන් පැන යෑමෙන් ම වික්‍රමසිංහ මහතාට ඒ විවේචනවලට මුහුණ දීමට ශක්තියක් නො තිබී යැයි යමකු නිගමනය කළ හොත් අප ඒ සම්බන්ධයෙන් කියන්නේ කුමක් ද?

මා මාර්ටින් වික්‍රමසිංහ මහතා ඇසුරු කර නැත. සරච්චන්ද්‍ර මහතා සුළුවෙනුත්, ගුණදාස අමරසේකර මහතා එයට වැඩියෙනුත් දැන කියා ගැනීමට මට හැකි විය. එමෙන් ම බටහිර විද්‍යා ක්ෂේත්‍රයෙහි ජය කෙහෙළි නැංවූවන් යැයි කියන අය ද මට ඇසුරු කිරමට ලැබී ඇත. ඒ සියල්ලන්ට මෙරට සමාජයෙහි වැදගත්කමක් ලැබී අත්තේ ම ඔවුන් මෙරට ජනතාවගෙන් ඈත් ව ජීවත් වූ බැවිනි. ජනතාවගෙන් ඈත් ව ජීවත් විණි ය යන්නෙන් මා අදහස් කරන්නේ ඔවුන් සාමාන්‍ය ජනතාව සමග ඇසුරක් නො පැවැත්වී ය යන්න නො වෙයි. ඔවුහු මෙරට ජනතාවගේ අදහස්වලින් ඈත් ව විසූ හ: ඈත් ව වෙසෙති. ඒ අතර ඔවුහු ඊනියා උගතුන් අතර මෙරට පිළිගත් අදහස් වෙනස් කිරමට කටයුතු කළ හ. ඔවුන්ට එසේ කිරමට හැකියාවක් ලැබුණේ හුදෙක් ඔවුන්ගේ දක්ෂතාව නිසා නො ව ඔවුන් මෙරට ප්‍රචාරය කෙළේ බටහිර ආධිපත්‍යවාදී අදහස් වීම නිසා ය.

ගුණදාස අමරසේකර මහතාට අදත් ඊනියා උගතුන් අතර පිළිගැනීමක් ඇත්තේ ඔහු අද පවසන දේශපාලන අදහස් නිසා නො වන බව අපි කවුරුත් දනිමු. ඒ මහතාගේ දේශපාලන අදහස් විවේචනය කරන අයෙක් තවමත් ඒ මහතා අතින් එකල ලියැවුණු කසිකබල් සාහිත්‍යය අගය කරති. එසේ කරන්නේ තම පැරණි සාහිත්‍ය තමන් ම ප්‍රතික්ෂේප කිරම පිළිබඳ ව අමරසේකර මහතාට දොස් පවරමිනි. මෙරට ඊනියා උගතුන් ප්‍රශංසා කරන්නේ ඔවුන් දීන ව අනුකරණය කරන බටහිර අදහස්, මතිමතාන්තර වමාරන්නන්ට මිස අනෙක් අයට නො වේ. අමරසේකර මහතාගේ පැරණි අදහස් හා සාහිත්‍ය බටහිරයන්ගේ මතිමතාන්තර සිංහල සමාජයට ගෙන යෑමට ඉවහල් වූ බැවින් මේ උගත්තු පැරණි අමරසේකරට ප්‍රශංසා කරන අතර අද වෙනත් දේශපාලනයක් ගැන කතා කරන නූතන අමරසේකරට විරුද්ධ වෙති.

පෞද්ගලිකව යමක් කිව යුතු නම් මට කිව හැක්කේ මෙරට උගතුන් යැයි කියාගන්නවුන් අතර මා පිළිගැනීමට ලක් වී නොමැති බව මා ඉතා හොඳින් දන්නා බව ය. මා විද්‍යාව, සාහිත්‍යය ආදිය හා පොදුවේ දැනුම ගැන දක්වන අදහස් ඔවුන්ට වහකදුරු මෙන් බව ද මම දනිමි. මා විද්‍යාව සම්බන්ධයෙන් දක්වන අදහස් මාගේ රැකියාව සම්බන්ධයෙන් ද මට බලපා ඇත්තේ වරක් දෙවරක් නො වෙයි. එහෙත් මේ උගතුන් ගැන මම සැලකිල්ලක් නො දක්වමි. මට ඔවුන් අතර බුද්ධිමතකු, උගතකු හෝ වෙනත් ප්‍රබුද්ධයකු පිළිගැනීමක් අවශ්‍ය නො වේ. මා පළ කරන්නේ මෙරට ජන සමාජයෙහි ඇති අදහස් මිස බටහිරයන්ට අවශ්‍ය අදහස් නො වේ. සිංහල බෞද්ධ සමාජයෙහි අවිඥානික ව ඇති

අදහස් සවිඥානිකව ව ප්‍රකාශ කිරමට මම උත්සාහ කරමි. මගේ අප්‍රබුද්ධ බව හා ළිං මැඬි කොදෙව් දැනුම ගැන මම ආඩම්බර වෙමි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා පැරණි සිංහල ලකුණෙහි දෘශ්‍යමානය ගැන පළ කර ඇති ඇතැම් අදහස් වටිනාකමකින් යුක්ත ය. එමෙන් ම සරච්චන්ද්‍ර මහතා මනමේ, සිංහබාහු නාට්‍ය නිෂ්පාදනය කිරමෙන් මෙරට නාට්‍ය කලාවට කර ඇති සේවය ද අප අගය කළ යුතු ය. එහෙත් එපමණකින් ඔවුහු අප මත බටහිර අදහස් පැටවීම සම්බන්ධයෙන් නිදොස් නො වෙති. අපි මෙහි දී එක් උදාහරණයක් පමණක් ගනිමු. මනමේ නාට්‍යය අපේ සංස්කෘතියෙහි කලාත්මක නිර්මාණයක් ය යන්න විවාද රහිත ය. එහෙත් එයින් පළ කිරමට උත්සාහ කළ දර්ශනය ගැන අපට කිවහැක්කේ කුමක් ද? ඒ අපේ දර්ශනය ද? චුල්ල ධනුද්ධර ජාතකයෙහි මනමේ කුමරු අත්හැර වැද්දාගේ හැඩි දැඩි පිරිමි සිරුරට ලොල් වන මනමේ කුමරියගේ ක්‍රියාව හිවලකු විසින් ද ගර්හාවට පත් කෙරෙයි. එහෙත් මනමේ නාට්‍යයෙහි මනමේ කුමරිය දෙස සානුකම්පිකව බැලීමට සරච්චන්ද්‍ර මහතා උත්සාහ ගෙන තිබෙ යැයි උගත්තු පවසති.

මේ සානුකම්පික කතාව මෙරට උගත්තු විචාරයකින් තොර ව පුනරුච්චාරණය කරති. අප මිනිසුන්ට හා ගැහැනුන්ට ඔවුන් අමාරුවේ වැටුණු විට අනුකම්පා කළ යුතු ය. ඒ පිළිබඳ විවාදයක් නැත. විපතට පත් අයට අනුකම්පා කිරම සිංහල බෞද්ධ ජීවන ක්‍රමයට පටහැනි නො වෙයි. වැදි රජු විසින් ද අත්හරිනු ලැබූ මනමේ කුමරියට අප අනුකම්පා කළ යුතු ය. එහෙත් අප ඇය කළ දෙයට අනුකම්පා කළ යුතු ද? අපේ අනුකම්පාව ලැබිය යුත්තේ කා හට ද? කුමකට ද? අප විපතට පත් මනමේ කුමරියට අනුකම්පා කරන අතර ම ඒ විපතට හේතු වූ හැසිරම හෙළා දැකිය යුතු ද? නැද්ද? ප්‍රශ්නය මෙලෙසින් සූත්‍රගත කළ විට විවිධ අය විවිධ පිළිතුරු ලබා දෙනු ඇත. එහෙත් ප්‍රශ්නය එසේ සූත්‍රගත නො කෙරුණු විට මනමේ කුමරියට අනුකම්පා කිරම ගැන ප්‍රේක්ෂකයන්ගේ සිත්වලට යන්නේ කිනම් අදහසක් ද? මනමේ (හා රේබාවේ) සිට අකෂරය දක්වා පැමිණි ගමනට ගත වී ඇත්තේ අවුරුදු පණහක් පමණක් වීම කවර අනුභසකින් සිදු වූවක් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva